www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

සසප කොළඹ දී ප්‍රසිද්ධ දේශනයක් පැවැත්වීමට යයි

# ඉරාක මහජනතාවට එරෙහි යුද්ධය නතර කරනු! ඉරාකයෙන් එක්සත් ජනපද හමුදා ඉවත් කරනු!

## SEP to hold public lecture in Colombo: Stop the war on the Iraqi people! Withdraw US troops from Iraq!

**2004 අප්‍රේල් 19**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප), ඉරාකයේ පවත්නා එක්සත් ජනපද නායකත්වයෙන් යුත් මිලිටරි වාඩිලාගැනීමට එරෙහිව, බදාදා, කොළඹ දී ප්‍රසිද්ධ දේශනයක් පවත්වනු ඇත. “ඉරාක මහජනතාවට එරෙහි යුද්ධය නතර කරනු! ඉරාකයෙන් එක්සත් ජනපද හමුදා ඉවත් කරනු!” යන මැයෙන් මෙම දේශනය ඉදිරිපත් කරනු ලබන්නේ, සසප ප්‍රධාන ලේකම් හා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික විජේ ඩයස් විසිනි.

එක්සත් ජනපදය ඉරාකයට එරෙහිව සිදු කල නීති විරෝධී ආක්‍රමනයෙන් යන්තම් වසරක් ඉක්ම යන තතු තුල, බුෂ් ආන්ඩුව යෙදී සිටින්නේ, ඉරාකයේ මහජනතාවගේ විරුද්ධත්වය මෘග ලෙස මැඩීමේ වැඩකටයුතුවල ය. පසුගිය දෙසතිය තුල, සිය ගනන් මිනිසුන්, ගැහැනුන් හා ළමුන් ඝාතනයට ලක් කෙරී තවත් දහස් ගනනක් තුවාල ලබා ඇත. පසුගිය සිකුරාදා බුෂ් හා බ්ලෙයාර් අතර පැවති අර්බුදකාරී හමුවේ දී, තමන් ආපසු හැරීමක් නො කරන බව මෙම නායකයන් දෙදෙනාම අවධාරනය කල අතර, එම රැස්වීමෙන් ඉක්බිති වඩා දරුනු ප්‍රචන්ඩ ප්‍රහාර සූදානම් කෙරෙමින් පවතී.

වොෂිංටනයට දැන් මුහුන දීමට සිදුව ඇත්තේ, ඉරාකයේ එය පවත්වාගෙන යන විජිතවාදී වාඩිලාගැනීමට එරෙහි වීරෝධාර මහජන නැගිටීමකට මිස අනෙකකට නො වේ. බැග්ඩෑඩ් නගරයේ දරිද්‍ර මුඩුක්කු පෙදෙස්වල සිට ෆලූජා, නජාෆ්, නසිරියා, බස්රා නගරවලට හා සෙසු ප්‍රදේශවලට පැතිර ඇති කැරැල්ල මගින් එක්සත් ජනපදයේ අපරාජිත භාවය පිලිබඳ මිථ්‍යාව බිඳ දමා ඇත.

ලොව වටා කම්කරුවෝ, ඉරාක මහජනතාවගේ ප්‍රතිරෝධතා ව්‍යාපාරයට සහයෝගය දිය යුතු ය. එක්සත් ජනපද වාඩිලාගැනීමේ ඉලක්කය වන්නේ, ඉරාකයේ සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම නො ව, මැද පෙරදිග හා මධ්‍යම ආසියාව පුරා ආධිපත්‍යය තහවුරු කරගැනීමේ සිය පුලුල් සැලසුම්වල කොටසක් ලෙස, ඉරාකයේ තෙල් සම්පත් මත වොෂිංටනයේ ආධිපත්‍යය සහතික කරගැනීමයි.

එක්සත් ජනපද නායකත්වයෙන් යුත් ආක්‍රමනයට විරුද්ධ බව කියා පාන දේශපාලන පක්ෂ ඇතුලු ශ්‍රී ලංකාවේ සමස්ත සංස්ථාපිතය ම මේ සම්බන්ධයෙන් පවත්වා ගෙන යන සාපරාධී නිශ්ශබ්දතාව, සසප හෙලා දකී. ඉරාකයෙන් සියලු විදේශ හමුදා කොන්දේසි විරහිතව හා වහා ම ඉවත් කල යුතුයි ස්ථිරසාරව ඉල්ලා සිටි එකම පක්ෂය සසපයි. මෙම ආක්‍රමනික යුද්ධය සැලසුම් කිරීම හා සංවිධානය කිරීම පිලිබඳ වගකිව යුතු සියලු දෙනා, ප්‍රසිද්ධියේ එලිදරව් කොට යුද අපරාධ සම්බන්ධයෙන් නඩු විභාගයට ලක් කල යුතු යයි අපි අවධාරනය කර සිටිමු. සසප ආධාරකරුවන් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨකයන් සියල්ලන්ගෙන් ම අප ඉල්ලා සිටින්නේ, මෙම වැදගත් රැස්වීමට සහභාගි වන ලෙසයි.

**ස්ථානය:** ගුරුමැදුර
(ශ්‍රී ලංකා ජාතික ගුරු සංගම් ශාලාව,
මහජන බැංකු මූලස්ථානය පිටුපස)
කොළඹ 2.

**දිනය:** 2004 අප්‍රේල් 21 වන බදාදා

**වේලාව:** සවස 4.00

© www.wsws.org